# A Sourced Introduction to virtue, Morality and *Nibbāna*

සීලය සදාචාරය හා නිර්වාණය පිළිබඳ මූලාශ්‍රයාගත හැඳින්වීමක්.

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

ආදි බුදුදහමේ නොයෙකුත් සූත්‍රාන්ත පිළිබඳ විමසා බැලීමේ දී, මිනිසා මැරෙමින් ඉපදෙමින් ගමන් කරන්නා වූ මෙම සසර මහා දුකක් ලෙස අර්ථවත් වී ඇත. අවිද්‍යා නීවරණයන්ගෙන් ආවරණය වූ, තණ්හා සංයෝජනයෙන් බැඳුණා වූ සත්ත්වයාගේ පූර්වාග්‍රයක් පැණවිය නොහැකි බවත්, මිනිසා දිගු කාලයක් සංසාරයේ දුක් අනුභව කොට ඇති බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත.

***"අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති. අවිජ්ජානීවරණානං සත්තානං තණ්හා සංයොජනානං සංධාවතං සංසරතං දීඝ රත්තං වො භික්ඛවෙ දුක්ඛං පච්චනුභූතං"*** [1]

එසේම මෙම ලෝකය දුෂ්කරතාවයට වැටී ඇති බවත්, මිනිසා ඉපදෙයි, දිරයි, මිය යයි, චුත වෙයි, නැවත උපදියි, මේ ජරා මරණ දුකෙහි නිස්සරණයක් කවරදාක නම් පනවන්නේ දැයි පෙන්වා දෙමින් මෙම සසර මහා දුකක් ලෙස අර්ථවත් වූ අවස්ථා මුල් බුදුසමයේ නොයෙක් විට දක්නට ලැබේ.

***"කිච්ඡං වතායං ලොකො ආපන්නො ජායති ච ජීයති ච මීයති ච චවති ච උප්පජ්ජති ච අථ ච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති. ජරා මරණස්ස. කුදාස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණස්ස පඤ්ඤායිස්සති ජරාමරණාස්සාති"*** [2]

සං.නි. කෝටිගාම සූත්‍රය පිළිබඳ විමසා බැලීමේ දී සංසාරය මහත් වූ දුකක් බවත්, එය පදනම් වන්නා වූ චතුරාර්ය සත්‍යය අවබෝධ කොට නොගන්නා වූ මිනිසා සසරේ මැරෙමින් ඉපදෙමින් අනන්ත වූ දුක් අනුභව කරන බව විස්තර කොට ඇත.

***"චතුන්නං භික්ඛවෙ අරියසච්චානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං භික්ඛවෙ දීඝමද්ධානං සංධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච"*** [3]

මේ ආකාරයට මුල් බුදුසමය පිළිබඳ විමසා බැලීමේ දී සංසාරය යනු මහා දුකක් ලෙස විස්තර වී ඇත. එබැවින් බුදුරජාණන් වහන්සේ ***"දුක්ඛෙ ලොකො පතිට්ඨිතො"*** [4] මෙම ලෝකය දුක මතම පිහිටා ඇති බව දේශනා කොට ඇත.

මෙසේ මහත් වූ දුකක් ලෙස දැක්වූ සංසාරයේ නැවැත්ම හෙවත් නිස්සරණය නිර්වාණය යි. එය පරම සැපතකි. ***"නිබ්බාණං පරමං සුඛං"*** [5] එහෙයින් සංසාරය දුකක් නම් නිවන සැපයකි. සසර බන්ධනයක් නම් නිවන විමුක්තියකි. සසර මහා භය මහෝඝයක් නම් නිවන ක්ෂේම වූ දිවයිනකි. එය සංසාරයට පටහැනි වූවකි. නිවන් ලැබූ පුද්ගලයා තුළ සසර දුක් උදාකරන්නා වූ රාග, ද්වේෂ, මෝහ

ආදී වූ කෙලෙස් ධර්මයන් සම්පූර්ණ වශයෙන් ප්‍රහීන වී ඇත. ***''යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති ආවුසො නිබ්බානං''***[6]

මෙසේ පරම වූ සැපතක් ලෙස අර්ථවත් වන්නා වූ "නිබ්බාණ" යන්නෙහි පදගතාර්ථ පිළිබඳ විමසා බැලීමේදී ද ''බාණ'' යනු මිනිසා සසරෙහි ඇද බැද තබන්නා වූ තෘෂ්ණාව ආදී වූ කෙලෙස් ධර්මයෝ ය. එසේම ''නි'' යනු එම කෙලෙස් ධර්මයන් සම්පූර්ණ වශයෙන් ප්‍රහාණය කිරීම යි. මෙසේ ක්ලේෂ ධර්ම සම්පූර්ණ වශයෙන් නැතිකර දැමීමෙන් මිනිසාට පරම වූ සැපතක් උදා කරගත හැකි බව පැහැදිලි වේ.

මූලික සූත්‍ර දේශනා පිළිබඳ විමසා බැලීමේ දී ද ''නිබ්බාණ'' යන්න පරම වූ සැපතක් ලෙස අර්ථවත් වී ඇත.

- ***''සබ්බසොක අතික්කන්තො - අසොකො හොති නිබ්බුතො''***[7]

  (නිවන් ලද පුද්ගලයා සියලු ශෝක ඉක්මවා ශෝක නැත්තෙක් බවට පත්වෙයි.)

- ***''නිබ්බාණං සුඛාපරං නත්ථි''***[8]

  (නිවන් සුවයට වැඩි සුවයක් නොමැත.)

- ***''ඵුට්ඨස්ස පරමාසන්ති නිබ්බාණං අකුතො භයං''***[9]

  (පරම ශාන්තිය ස්පර්ශ කොට නිවන් ලද තැනැත්තාට කවර විදියේ හෝ භයක් නැත.)

- ***''හිත්වා රතිඤ්ච අරතිඤ්ච සීතිභූතං''***[10]

  (රතිය සහ අරතිය දෙකම අතහැර නිවී ගියේය.)

- ***''සබ්බ මිත්තො සබ්බසඛො සබ්බභූතානුකම්පකො''***[11]

  (සියල්ලන්ටම මිතුරුය. සියල්ලන්ගේම සඟයෙකි. සියල්ලන්ගේම හිතසුව පතන්නෙකි.)

- ***''එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාණං''***[12]

  (සියලු සංස්කාරයන්ගේ සිඳීමක්, සියලු උපධීන්ගේ දුරලීමක්, තෘෂ්ණාව ක්ෂය වීමක්, විරාගයක්, නිර්වාණයක් වේ ද, එය නිවන යි.)

මේ ආකාරයට මූලික සූත්‍ර දේශනා විමසා බැලීමේ දී "නිවන" යනු පරම වූ සැපතක් ලෙස විස්තර වී ඇත. එසේම, එම නිවනත්, සංසාරයත් දෙකම මිනිසා තුළම පවත්නා වූ සත්තාවක් ලෙස ආදි බුදුසමයේ විස්තර වේ. එය කාලයෙන්, දේශයෙන් ඔබ්බෙහි පිහිටි අධිභෞතික වූ ලෝකෝත්තර තත්වයක් නොව, මෙලොව ජීවිතයේ දී ම අවබෝධ කොට ගතයුතු යථාර්ථාවබෝධයකි. එසේම පුද්ගල අනුභූතියෙන් සාක්ෂාත් කරගත යුතු නිෂ්ඨාවකි.

***''ඉමස්මිං යෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකං ච පඤ්ඤපෙමි. ලොක සමුදයඤ්ඤ ච, ලොක නිරොධඤ් ච ලොක නිරොධ ගාමිණි පටිපදං ච''***[13]

(මේ සිත් පිත් සහිත වූ, බඹයක් පමණ වූ සිරුරෙහි ම ලෝකයත්, ලෝකයෙහි හට ගැනීමත්, ලෝක නිරෝධයත්, නිරෝධයට පැමිණෙන මඟත් දක්වමි.)

යන දේශනා තුළින් උක්ත කාරණාව මනාව පැහැදිලි වේ. එසේම එය සාන්දෘෂ්ටික ය. තමන් විසින් ම නුවණින් දැන මෙලොව දී ම පසක් කළ යුතුය. එහිපස්සිකය. එව, බලවැයි' දැක්විය හැකිය. ***''සනදිට්ඨිකො එහිපස්සිකො''*** බුද්ධා දී රහත්හු මෙලොවදී ම යථාර්ථය දැන, දැක, පසක් කොට එයට එළඹ වාසය කරති.

***''දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති''***

මෙසේ මිනිසා විසින් මෙලොව දී ම තමන් විසින් ම අවබෝධ කොටගත යුතු, දැන දැක පසක් කළ යුතු නිර්වාණය අන්‍යාගමික දාර්ශනික සංකල්පයන් හා සසදා බැලීමේ දී, බෞද්ධ නිර්වාණය තුළ සුවිශේෂතාවයක් දක්නට ඇත. එනම්, බුදුසමය තුළ පෙන්වා දෙන්නා වූ නිවන පරම වූ නිෂ්ඨාවකි. එය පහන් සිලක් බඳු ය. ***''නිබ්බන්ති ධීරා යථායං පදීපො''*** [14] එසේ ම එය පරම සැපතකි. ***''නිබ්බාණං පරමං සුඛං''*** [15]

මෙසේ බුදුසමයේ තුළ දැක්වෙන නිවන පරම නිෂ්ඨාවක් වුව ද, අන්‍ය දර්ශනයන් තුළ දැක්වෙන විමුක්ති සාධනයන් පරම වූ නිෂ්ඨාවන් ලෙස අර්ථවත් වන්නේ නැත. ඒවා ශාස්වතවාදී ලක්‍ෂණයන්ගෙන් යුක්ත වේ. නැවත නැවත භව සාධනය සඳහා හේතු වේ. නිදසුනක් ලෙස හින්දු දහම පිළිබඳ විමසා බැලීමේ දී, ඔවුන්ගේ විමුක්ති සාධනය වූයේ ''බ්‍රහ්මසහව්‍යතාවය යි.'' එනම්, බ්‍රහ්මන්ගේ පරමාර්ථය හා ඒකත්වයට පැමිණීම යි. ඒ සඳහා ඔවුහු නොයෙකුත් පුද පූජා සිරිත් පැවැත්වීම, යාග හෝම සිදුකිරීම ආදී වැනි ක්‍රියා පිළිවෙත් අනුගමනය කළහ. එය ඔවුන්ගේ නිර්වාණ මාර්ගය විය. මෙම ප්‍රතිපදාව තුළ ඔවුන්ට පරම නිෂ්ඨාවක් කිසිසේත් අපේක්‍ෂා කළ නොහැක.

එසේම ජෛන දහම තුළ විමුක්තිය ලෙස දැක්වූයේ ආත්ම විමුක්තිය ලබාගැනීම යි. එසේ නැතහොත් ''කේවලත්වය ප්‍රාර්ථනා කිරීම යි.'' ඒ සඳහා ඔවුහු නොයෙකුත් ව්‍රත සමාදානයන් තුළ අත්තකිලමතානුයෝගී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කළහ.

මීට අමතරව කිතු දහම තුළ විමුක්තිය ලෙස අර්ථවත් වූයේ ''ස්වර්ග රාජ්‍යය උදාකර ගැනීමයි'' එසේම යුදෙව් දහම තුළ ''ගැළවුම්කරුවෙකු පැමිණෙන තුරු බලා සිටීම'' විමුක්තිය ලෙස දක්වා ඇත. මෙම සියලු ආගමික දර්ශයන් තුළ පරම නිෂ්ඨාවක් අර්ථවත් වී නොමැත. නමුත් බුදු සමයේ දක්වන්නා වූ නිර්වාණය මේ සියල්ලෙන් වෙනස් වූවකි. ඒ තුළ පරම වූ නිෂ්ඨාවක් අන්තර්ගත ය.

මෙසේ බුදුසමය උගන්වන්නා වූ නිර්වාණය සදාචාරාත්මක පසුබිමක නිර්මාණය වූවකි. එම සදාචාරයේ ප්‍රාරප්ප්‍රාප්තිය නිර්වාණය ලෙස දක්වා ඇත. නිර්වාණගාමී මාර්ගයට අවතීර්ණ වූ පුද්ගලයා එහි මුලින්ම පූර්ණත්වයට පත් කරනුයේ සීලය යි. සීලයෙන් අනතුරුව සමාධිය වඩා ප්‍රඥාව

ඔහු වර්ධනය කරගනු ලබයි. ***"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤං ච භාවයං"***[16] මෙසේ සීලය සදාචාරාත්මක මාර්ගයේ ආරම්භය ලෙස දැක් වේ.

විශුද්ධිමාර්ග අට්ඨකථාවෙහි තුණුරුවන්ට, දෙමාපියන්ට, සිල්වතුන්ට, ගුණවතුන්ට, වැඩිහිටියන්ට, ගිලනුන්ට උපස්ථාන කිරීම් ආදි වතාවත් පිරීමේ කුසල චේතනාව නම් වූ චේතනා සීලය ද, සතුන් මැරීමෙන් වැළකීම, සොරකමින් වැළකීම ආදි වූ දුරාචාර, දුෂ්චරිත, දුරාජීවයන්ගෙන් වැළකීම නම් වූ විරති සීලය ද, සතියෙන්, නුවණින්, ඉවසීමෙන්, සිඛපදයෙන් සංවර වීම නම් වූ සංවර සීලය ද, ලාභ සත්කාර, යස කීර්ති, ඥාති, මිත්‍ර, ශරීරාවයව, සිය ජීවිතය ගැනවත් නොතකා සිඛපද නොබිඳ රක්නා බව නම් වූ අවීතික්කම සීලය ද යනුවෙන් සීල ප්‍රභේදයන් දක්වා ඇත.

මීට අමතරව ත්‍රිපිටකය තුළ පැතිරී පවත්නා වූ සීලයේ ප්‍රභේද පනස්හයක් පිළිබඳව ද එහි දැක්වේ. ඒ අනුව සීලය ලක්ෂණ වශයෙන් එකකි. එය නැවත දෙක බැගින් රාශි හතක් ද, තුන බැගින් රාශි පහක් ද, සතර බැගින් රාශි සතරක් ද, පහ බැගින් රාශි දෙකක් ද යනුවෙන් සියල්ල පනස් හයක් වේ.

මෙහි දෙකේ රාශි හත මෙසේ දක්වා ඇත. 01) චාරිත්‍ර සීල, වාරිත්‍ර සීල 02) විරති සීල, අවිරති සීල 03) ආභිසමාචාරික සීල, ආදිබ්‍රහ්මචරියක සීල 04) කාලපරියන්ත සීල, ආපානකෝටික සීල 05) සපරියන්ත සීල, අපරියන්ත සීල 06) නිස්සිත සීල, අනිස්සිත සීල 07) ලෞකික සීල, ලෝකෝත්තර සීල. එසේම තුන බැගින් ඇති ශීල රාශි පහ ලෙස, 01) හීන සීලය, මධ්‍යම සීලය, ප්‍රණීත ශීලය 02) අත්තාධිපති සීලය, ලෝකාධිපති සීලය, ධම්මාධිපති සීලය 03) පරාමට්ඨ සීලය, අපරාමට්ඨ සීලය, පටිප්පස්සද්ධි සීලය 04) විශුද්ධ සීලය, අවිශුද්ධ සිලය, වේමතික සීලය 05) සේඛ සිලය, අසේඛ සිලය, නේවසේඛ සීලය. යන සීලයන් ද, සතර බැගින් ඇති සීලරාශී සතර ලෙස 01) හානභාගිය සීලය, ඨිති භාගිය සීලය, විශේෂ භාගිය සීලය, නිබ්බේධභාගිය සීලය 02) භික්ෂු සීලය, භික්ෂුණී සීලය, අනුපසම්පන්න සීලය, ගහට්ඨ සීලය 03) ප්‍රකෘති සීලය, ආචාර සීලය, ධර්මතා සීලය, පූර්ව හේතුක සීලය 04) ප්‍රාතිමෝක්ෂ සංවර සීලය, ඉන්ද්‍රිය සංවර සීලය, ආජීව පාරිශුද්ධ සීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලය. යන සීලයන් ද, පසක් බැගින් ඇති සීල රාශි දෙකොටස ලෙස 01) පරියන්ත පාරිශුද්ධ සීලය, අපරියන්ත පාරිශුද්ධ සීලය, පරිපුණ්ණ පාරිශුද්ධ සීලය, අපරාමට්ඨ පාරිශුද්ධ සීලය, පටිප්පස්සද්ධි පාරිශුද්ධි සීලය 02) ප්‍රහාණ සීලය, වේරමණි සීලය, චේතනා සීලය, සංවර සීලය, අවිතික්කම සීලය. යන සීලයන් ද, යනුවෙන් සීලය පනස්හය වැදෑරුම් ලෙස දක්වා ඇත.

මෙසේ වන්නා වූ සීලය ආරක්ෂා කරන්නා සීලය නිසා ම කාය වාග් සංවරයෙන් සුසංවෘත වූයේ, ලෞකික අපේක්ෂාවෙන් තොර වූ බැවින් ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා ගුණයන්ගෙන් සිත පිරිසිදු කරගනී. ඔහු කවර තැනක දී වුව ද, කවර ඉරියව්වක දී වුව ද සමථ විදර්ශනා භාවනාවකට යෙදෙන ඕනෑම වේලාවක දී පිරිසිදු වස්ත්‍රයකට නිසි සේ සායම වැද ගන්නා සේ චිත්ත සමාධිය සුවසේ ලබාගනී.

මෙසේ සීලයෙන් ආරම්භ කොට සමාධිය වඩන්නා වූ පුද්ගලයා ඉන් අනතුරුව ප්‍රඥාවට යොමු වේ. ප්‍රඥාව යනු කුසලධර්ම වර්ධනය යි. එනම් සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් සම්පූර්ණ කිරීමය යි. සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් සම්පූර්ණ කිරීම තුළින් පුද්ගලයාට සියලු අකුසල ධර්ම නැති කිරීමටත් කුසල ධර්ම සම්පූර්ණ කිරීමටත් හැකි වේ. ***"සබ්බාකුසලධම්ම පහීනො කුසලධම්ම***

***සමන්නාගතො'***[17] මෙසේ සියලු අකුසල ධර්ම නැති කිරීමත්, කුසල ධර්ම සම්පූර්ණ කිරීමත් යනු මිනිසා සදාචාරයේ පාරප්ප්‍රාප්තියට පත් වීමයි.

සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් පිළිබඳ මූලික සූත්‍ර දේශනා රාශියක දක්නට ඇත. දී.නි. සක්කපඤ්ඤ සූත්‍රය, ම.නි. සාමගාම සූත්‍රය, ම.නි. කින්ති සූත්‍රය, දී.නි. සංගීති සූත්‍රය, මහා සළායතන සූත්‍රය ආදී සූත්‍ර රාශියක මේ පිළිබඳ විස්තර දැක්වේ. මෙහි දී විශේෂ වශයෙන් දී.නි. සක්කපඤ්හ සූත්‍රය ඉතා වැදගත් ය. මෙහි දක්වා ඇති ආකාරයට සතර සතිපට්ඨාන වැඩීම, සතර සම්‍යක්ප්‍රධානයෙන් යුක්ත වීම, සතර ඍද්ධිපාද වර්ධනය කිරීම, පංච ඉන්ද්‍රියයන් වර්ධනය කිරීම, පංච බලයෙන් යුක්ත වීම, සත්ත බොජ්ඣංග ධර්මයන් වර්ධනය කිරීම හා ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීම යන කරුණු තිස්හත සත්තිස්බෝධිපාක්ෂික ධර්මයෝ වෙති. මෙම ධර්ම සම්පූර්ණ කළ පුද්ගලයා කුසලධර්ම සම්පන්න පුද්ගලයෙකු බවට පත්වෙයි. එසේම ඔහු සදාචාරයේ පාරප්‍රාප්තියට පැමිණියේ වෙයි. ඔහු සියලු ආශ්‍රවයන් ප්‍රහීන කල, වෙසෙන ලද බඹසර ඇති, කළ යුතු දේ කොට නිම වූ, බහා තැවූ බර ඇති, පරමාදර්ශයට පැමිණි, භව සංයෝජන බිඳ දැමූ මනාව හික්මුණු පුද්ගලයෙක් ද වේ.

***''ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො''***

එසේම සදාචාරාත්මක පැවැත්මක අර්ථවත් වන්නා වූ මෛත්‍රීව, කරුණාව, මුදිතාව, උපේක්ෂාව යන සතර බඹ විහරණයන්ගේ පාරප්‍රාප්තියට පත් වූ පුද්ගලයා නිර්වාණය සාක්ෂාත් කළ පුද්ගලයෙකු බව දක්වා ඇත. ඔහුට නැවත පිරිය යුතු සීලයක් හෝ වර්ධනය කළ යුතු කුසල ධර්මයක් නොමැත. ඔහු කුසලයෙහි හා සීලයෙහි අග්‍රභාවයට පත් වී ඇත.

***''ඉති ඛො ආනන්ද කුසලානි සීලානි අනුපුබ්බේන අග්ගාය පරෙන්ති''***[18]

මෙසේ නිර්වාණය සාක්ෂාත් කළ පුද්ගලයා සදාචාරයේ ප්‍රාරප්ප්‍රාප්තියට පත් වූවෙකි. ඔහු තුළ පවත්නා වූ සදාචාරය වෙනත් කිසිවෙකු තුළ අර්ථවත් නොවේ. එසේම ඔහු තුළින් කිසිදු දුසිරිතක් සිදුවිය නොහැක.

නිර්වාණය තුළින් සිදුවන්නා වූ චර්යාත්මක පරිවර්තනය හා සදාචාරාත්මක පරිවර්තනය රහතන් වහන්සේලාගේ ජීවිතවලින් මනාව හෙළි වේ. උන්වහන්සේලා තෘෂ්ණාව ක්ෂය කොට ඇත්තේ ය. ***''තණ්හා තෙසං න විජ්ජති''***[19] රුචි අරුචීන් දුරුකොට සිහිල් වූයේ ය. ***''හිත්වා රතිඤ්ච අරතිඤ්ච සීතිභූතං''***[20] සියලු සත්වයින්ට අනුකම්පාව දක්වමින් මිතුරු වූයේ ය. ***''සබ්බ මිත්තො සබ්බසඛො සබ්බභූතානුකම්පකො''*** එසේම පසෙක තැබූ දඬු මුගුරු ආයුධ ඇතිව ප්‍රාණඝාතයෙන් වෙන්ව සර්වලොකහිතානුකම්පීව වසන්නාහ. ***''යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිත දණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා සබ්බපාණභූත හිතානුකම්පිනො විහරන්ති''***[21]

මෙසේ නිවන යනු සදාචාරයේ ප්‍රාරප්ප්‍රාප්තියක් බව පැහැදිලි ය. එසේම රතන සූත්‍රය පිළිබඳ විමසා බැලීමේදී ද උක්ත කාරණාව මනාව පැහැදිලි වේ. එහි දී නිවන් ලැබූ උතුමන් තුළින් කිසිදු

කායික වාචසික මානසික පවක් සිදු නොවන බවත්, එය රහත් උතුමන් කෙරෙන් අභව්‍ය වූ දෙයක් බවත් විස්තර වී ඇත.

***''කිඤ්චාපි සො කම්මං කරොති පාපකං***

***කායෙන වාචා උදචෙතසා වා***

***අභබ්බො සො තස්ස පටිච්ඡාදාය***

***අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා'***[22]

මීට අමතරව නිර්වාණලාභියා තුළින් පැරණි කර්ම ගෙවී ගිය බවත්, අලුත් කර්ම නූපදිනා බවත්, සසරෙහි නොඇලුණු සිත් ඇති බවත් එහි දක්වා ඇත.

***''ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං***

***විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං'***[23]

මේ ආකාරයට දැක්වූ කරුණු අනුව පෙනී යන්නේ නිර්වාණය යනු සදාචාරයේ ප්‍රාරප්ප්‍රාප්තිය බව යි. එසේම නිර්වාණය සාක්ෂාත් කළ පුද්ගලයාට වර්ධනය කළ යුතු සදාචාරාත්මක පිළිවෙතක් ද නොමැති බව ය. මෙහි දී සදාචාර වර්ධනය යනු සීලය පදනම්ව සත්තිස් බෝධිපාක්ෂික ධර්ම ආදී කුසල ධර්ම වර්ධනය කිරීම බව අවබෝධ කොට ගත යුතුය.

ආදි බුදුසමයේ නොයෙකුත් සූත්‍රාන්ත දේශනාවලට අනුව නිවන සදාචාරයේ පාරප්‍රාප්තිය ලෙස දැක්වුව ද පෙර - අපර දෙදිග ඇතැම් වියතුන් එය එසේ පිළිගැනීමට කැමැත්තක් දක්වන්නේ නැත. ඔවුන් නිර්වාණය යනු සදාචාරයෙන් බැහැර වූවක් ලෙසත්, එය ආත්මාර්ථය පදනම් කොටගත්තක් ලෙසත් දක්වා ඇත. ඔවුන් එසේ ප්‍රකාශ කිරීමට පදනම් කොට ගනු ලබන්නේ,

***''අනවස්සුත චිත්තස්ස අනන්වාහත චෙතසො***

***පුඤ්ඤපාප පහීනස්ස නත්ථි ජාගරතො භයං'***[24]

යන දේශනාවෙහි නිවන් ලැබූ උතුමන් පින් පව් දෙකම ප්‍රහීන කොට ඇති බව දක්වා තිබීම යි. එසේම වරක් මාරයා බුදුරජාණන් වහන්සේට පින් කිරීමට ආරාධනා කල අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ ***''අනුමත්තෙනාපි පුඤ්ඤෙන අත්ථො මය්හං න විජ්ජති'***[25] යනුවෙන් අල්පමාත්‍ර වූ පිනකින්වත් තමන් වහන්සේට ප්‍රයෝජනයක් නොමැති බව දක්වා තිබීම ද, උක්ත ප්‍රකාශයන් සඳහා පදනම් වී ඇත.

තව ද බුදුන් වහන්සේ වදාළ දුක්ඛ නිරෝධය පාලි නිකාය ග්‍රන්ථවල නිෂේධාර්ථවත් පදවලින් විස්තර වී ඇත ***''අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අසංඛතං…***''[26] මෙය ද පෙර - අපර දෙදිග වියතුන්ගේ උක්ත මතය සඳහා හේතු වී ඇත.

මෙම සියලු අදහස් දෙස විමසා බැලීමේ දී, ඒ සියල්ල බුදුදහම පිළිබඳ නිවැරදි අවබෝධයකින් තොරව ඉදිරිපත් කරන ලද අදහස් බව පෙනී යයි. බුදුසමය තුළ නිර්වාණය පින් - පව් දෙකම ප්‍රහීන කළ අවස්ථාවක් ලෙස දක්වා ඇති නමුදු, සදාචාරය තුළ අර්ථවත් වන්නා වූ කුසලය කිසිවිටෙක බැහැර නොකරයි. ***''සබ්බ අකුසල ධම්ම පහීනො කුසලධම්ම සමන්නාගතො'***[27]

යන්නෙන් එය මනාව පැහැදිලි වේ. මෙහි දී පෙර - අපර ඇතැම් වියතුන් පින සහ කුසලය එකක් ලෙස සළකා කටයුතු කොට ඇති බව පෙනේ. නමුදු පින සහ කුසලය අතර පැහැදිලි වෙනසක් දැකගත හැකි ය.

පින යනු පුද්ගල මෙලොව පරලොව භවගාමීත්වය සැප උදාකර දෙන්නකි. පින් කළ පුද්ගලයාට දෙලොව සැප විඳිය හැකි බව ***''ඉධ නන්දති පෙච්ච නන්දති - කත පුඤ්ඤො උභයත්ථ නන්දති''***[28] යනුවෙන් දක්වා ඇත. එසේම එය සංඛාර හෙවත් රැස් කිරීම් අර්ථයෙන් යෙදී ඇත. ***''පුඤ්ඤාභිසංඛාරං අභිසංඛරොති න අපුඤ්ඤාභිසංඛාරං අභිසංඛරොති''*** තව ද පින් කරන්නා විසින් නැවත නැවතත් එය කළ යුතුය. එයට කැමති විය යුතුය. පින් කිරීම සැපතට හේතු වේ.

***''පුඤ්ඤං චෙ පුරිසො කයිරා***

***කයිරා තෙ තං පුනප්පුනං***

***තම්හි ඡන්දං කයිරාථ***

***සුඛො පුඤ්ඤස්ස වුච්චයො''***[29]

මෙසේ පින මිනිසාගේ භවගාමීත්වය සැපවත් කරන නමුදු, පින තුළින් නිර්වාණය සාක්ෂාත් කළ නොහැක. ඒ සඳහා කුසලය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. කුසල ධර්ම වර්ධනය යනු ***''සබ්බ පාපස්ස අකරණං''*** සියලු පව්කම් නොකිරීම ය. සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාව වර්ධනය කිරීම ය. සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් ප්‍රගුණ කිරීම ය.

මෙසේ නිර්වාණගාමී වූ පුද්ගලයා තුළ පින් - පව් සහ අකුසල ධර්මයන් නොතිබුණ ද, කුසල ධර්මයන් අත්‍යන්ත වශයෙන් දක්නට ලැබේ. ***''කුසලධම්ම සමන්නාගතො''*** එහෙයින් ඔහු තුළ සදාචාරය මනාව ක්‍රියාත්මක වේ. එහි ද ඔහු පාරප්‍රාප්තියට පත් ව ඇත. ඔහුට යළි වර්ධනය කරගත යුතු සදාචාරයක් හෝ කුසලයක් දක්නට නොලැබේ. මෙසේ මෙම පුඤ්ඤ පාප කුසල - අකුසල පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති බැවින් පෙර - අපර ඇතැම් වියතුන් විසින් නිර්වාණය පිළිබඳ සාවද්‍ය වූ අදහස් ඉදිරිපත් කොට ඇති බව පැහැදිලි වේ.

බුදුසමය තුළ නිවනින් මෙපිට ද වන්නා වූ නොයෙකුත් සැපයන් පිළිබඳ විග්‍රහ වේ. අත්ථි සැප, අනන සැප, නිරාමිස සැප, මෙලොව සැප, පරලොව සැප ආදී වශයෙනි. නමුදු මෙම සියලු සැපයන් තාවකාලික වූ, කෙලෙස්වලින් බර වූ සැපයන් ය. නිර්වාණය යනු පරම සැපයකි. එය කෙලෙස් ධර්මයන්ගෙන් තොර වූවකි. පරම වූ නිෂ්ඨාවකි.

මෙසේ මිනිසා සදාචාරවත් වීම යනු කුසල ධර්ම වර්ධනය යි. කුසල ධර්ම වර්ධනය යනු සත්වයින් බෝධිපාක්ෂික ධර්ම පූර්ණය කිරීමයි. එහි අග්‍රඵලය නිර්වාණය සාක්ෂාත් කරගැනීම යි. එහෙයින් සදාචාරයේ පාරප්‍රාප්තිය නිර්වාණය ලෙස සඳහන් කළ හැක.

---

[1] සං. නි. II, අස්සු සුත්ත, බු.ජ.මු. 278 පිට.
[2] සං. නි. II, ගෝතම සුත්ත, බු.ජ.මු. 16 පිට.
[3] සං. නි. v, කෝටිගාම සුත්ත, බු.ජ.මු. 286 පිට.
[4] සං. නි., උච්චිත සුත්ත, බු.ජ.මු. 74 පිට.
[5] බු.නි. ධම්ම පද, 15-17

[6] සං. නි., අසංඛත සංයුත්ත, බු.ජ.මු.
[7] සුත්ත නිපාත පාලි
[8] ථෙරීගාථා පාළි
[9] එම
[10] සංයුත්තනිකායට්ඨකථා
[11] ථෙරගාථා පාළි
[12] අං.නි. ගිරිමානන්ද සුත්ත
[13] අං.නි. බු.ජ.මු., 218 පිට.
[14] බු.නි., සුත්ත නිපාත, චූළ වග්ග, රතන සුත්ත.
[15] බු.නි., ධම්මපද පාළි, බු.ජ.මු., 203 ගාථාව.
[16] සං.නි., ජටා සුත්ත, බු.ජ.මු., 26 පිට.
[17] ම.නි. II, බු.ජ.මු. 115 පිට.
[18] අං. නි. vi, බු.ජ.මු. 04 පිට.
[19] සං. නි. iii, බු.ජ.මු. 83 පිට.
[20] සුත්තනිපාත. බු.ජ.මු. 642 පිට.
[21] අං. නි. I, බු.ජ.මු. 211 පිට.
[22] බු.නි., සුත්ත නිපාත, චූළ වග්ග, රතන සුත්ත.
[23] එම
[24] බු.නි., ධම්මපද පාළි, 3 වග්ග, 07 ගාථාව.
[25] සං. නි., පධාන සුත්ත, බු.ජ.මු. 432 පිට.
[26] බු.නි., උදාන පාළි, බු.ජ.මු. 295 පිට.
[27] ම.නි. II, බු.ජ.මු. 115 පිට.
[28] බු.නි., ධම්මපද පාළි, 01 වග්ග, 18 ගාථාව.
[29] බු.නි., ධම්මපද පාළි, 09 වග්ග, 02 ගාථාව.